# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/27 – 2019 ජුනි 13 වැනි බ්‍රහස්පතින්දා – 2019.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය:* IR/COM/03/2018/123.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මයා, අංක 250, කොස්වත්ත, හල්මිල්ලවැව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී, 17 වන මහල, ලංකා බැංකු ගොඩනැගිල්ල, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඔබඩගේ ලීලාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවින්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

1A – G 30290 – 21 (2019/06)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*මගේ අංකය*: IR/COM/03/2018/123.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මයා, අංක 250, කොස්වත්ත, හල්මිල්ලවැව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී, 17 වන මහල, ලංකා බැංකු ගොඩනැගිල්ල, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

'' මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී, ආයතනයේ සේවය කළ එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතා විසින් ආයතනය වෙත ලබා දුන් ඉල්ලා අස්වීම පිළිනොගෙන විනය පරීක්ෂණයක් පවත්වා එම විනය පරීක්ෂණ තීරණය ලබා නොදී ආයතනයෙන් ඉල්ලා අස්වූ සේවකයෙකු ලෙස සැලකීම තුළින් එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතා අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ අසාධරණයක් සිදුවී තිබුණේ නම් ලබා දිය යුතු සහන කවරේ ද'' යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 834

---

*මගේ අංකය*: IR/COM/04/2019/139.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වතු හා කර්මාන්ත සේවක සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02.
2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය:* IR/COM/04/2019/139.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වතු හා කර්මාන්ත සේවක සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02
2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

“ දැනට වැඩ වර්ජනයට හේතුව පවතින ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් වෑකඩ සහ බුත්තල ගොවිපළවල්හි වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සේවයේ යොදවා ඇති සේවකයින්ගේ දෛනික වැටුප රු. 300/- (රුපියල් තුන්සීය)කින් වැඩි කරන ලෙස ඉල්ලා ලංකා වතු හා කර්මාන්ත සේවක සංගමය විසින් සිදු කරන ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත ද? යන්න හා එසේ සාධාරණ හා යුක්තිසහගත වන්නේ නම් ඔවුනට කුමන සහන ලැබිය යුතුද? යන්නත් පිළිබඳව වේ.”

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 835

---

*මගේ අංකය:* IR/COM/01/2017/236.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එල්. පී. ජයසුන්දර මයා, අංක 14/3, ඉසුරුපුර, කැස්බෑව, පිළියන්දල.
සහ
*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
සී/ස. එල්. ආර්. ඩී. සී. සේවා (පුද්ගලික) සමාගම, අංක 28/10, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන

පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/01/2017/236.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එල්. පී. ජයසුන්දර මයා, අංක 14/3, ඉසුරුපුර, කැස්බෑව, පිළියන්දල.
සහ
*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
සී/ස. එල්. ආර්. ඩී. සී. සේවා (පුද්ගලික) සමාගම, අංක 28/10, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ සී/ස. එල්. ආර්. ඩී. සී. සේවා (පුද්ගලික) සමාගමේ පිරිස් කළමනාකරු ලෙස 2011.02.10 දින සිට 2011.09.29 දින දක්වා සේවය කළ එල්. පී. ජයසුන්දර මහතාට අදාළ සේවා කාලයට දුරකථන දීමනාව හා ප්‍රවාහන දීමනාව සඳහා හිමිකමක් තිබේද? එසේ හිමිකමක් තිබේ නම් ඔහු හට හිමිවිය යුතු සහනය කුමක් ද යන්න පිළිබඳව වේ.”

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 836

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.